# ප්‍රධාන ලේකම් කාර්යාලය - වයඹ පළාත
பிரதான செயலாளர் அலுவலகம் - வடமேல் மாகாணம்
Chief Secretary's Office – North Western Province

පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල - மாகாண சபை அலுவலகத் தொகுதி, குருநாகல் - Provincial Council Office Complex, Kurunegala.

මූල්‍ය කළමනාකරණ අංශය
நிதி முகாமைத்துவ பிரிவு
Financial Management Division

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எமது இலக்கம் / My No | NWP/CS/F/5/ACC SUM | ඔබේ අංකය / உமது இலக்கம் / Your No | | දිනය / திகதி / 2019D | 2021.02 .10 |

වයඹ ආණ්ඩුකාරවර ලේකම් ,
වයඹ පළාත් සභා ලේකම් ,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**<u>මාසික ගිණුම් සාරාංශ ඉදිරිපත් කිරීම - 2021 වර්ෂය</u>**

2021 වර්ෂයේදී පළාත් භාණ්ඩාගාරයට මාසික ගිණුම් සාරාංශ ඉදිරිපත් කිරීම සඳහා සකස් කර ඇති නව PC SUM21 (Summary Conversion Programme) මෘදුකාංගය මේ සමඟ ඉදිරිපත් කරමි.එය වයඹ ප්‍රධාන ලේකම් කාර්යාලයේ නිල වෙබ් අඩවියෙන් (www.cs.nw.gov.lk) බාගත කර ගත හැකිය. එසේ නොමැතිනම්, පළාත් භාණ්ඩාගාරයට පැමිණ ලබා ගැනීමට ද අවස්ථාව සලසා ඇත.

02. **<u>පළාත් භාණ්ඩාගාරයට ගිණුම් ඉදිරිපත් කිරීමට යොදාගන්නා සාමාන්‍ය ක්‍රමවේදයට (PCSUM) අමතරව, NEW CIGAS හි Create PC File → Check යන වරණය භාවිතා කර මාසිකව සකස් කරන .....csv යන ගොනුව (උදා.260 T 1.csv) මාසිකව directacctpmt@gmail.com යන විද්‍යුත් ලිපිනයට අනිවාර්යයෙන්ම යොමු කළ යුතු වේ.</u>**

03. මාසික ගිණුම් දත්ත ඇතුලත් කර ගිණුම් සාරාංශය සකස් කළ පසු එය භාණ්ඩාගාරය ට ඉදිරිපත් කිරීමට පෙර,

I. වැය ගිණුම් , තැන්පත් ගිණුම්, අත්තිකාරම් ගිණුම්,ආදායම් ගිණුම් ආදියෙහි නිරවද්‍යතාවය ඔබගේ පොත් පත් අනුව පරික්ෂා කර බලා සහතික කළ යුතුය .

II. අග්‍රිම පාලන ලෙජරයක් අනිවාර්යයෙන්ම සකස් කල යුතු අතර ඒ ඇසුරෙන් අග්‍රිම ගිණුමේ ආරම්භක ශේෂය , භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිම, මාසික හර/බැර, නොපියවූ අත්තිකාරම් හා අවසාන අග්‍රිම ශේෂය CIGAS වැඩසටහනේ අග්‍රිම ගිණුම (Imprest Account No යන වරණය අනුව ) සමඟ පරීක්ෂා කර බලා සහතික කළ යුතුය.

III. ගිණුම් සාරාංශය හා ...csv ගොනුව භාණ්ඩාගාරයට ඉදිරිපත් කළ පසු කිසිදු ආකාරයේ සංශෝධනයක් CIGAS වැඩසටහන තුළ සිදු නොකළ යුතු අතර , එසේ සිදු කිරීමට අවශ්‍ය නම් පළාත් භාණ්ඩාගාරයේ ගිණුම් හා ගෙවීම් අධ්‍යක්ෂ දැනුවත් කිරීමෙන් අනතුරුව පමණක්ම සිදු කළ යුතු බව අවධාරණය කරමි.


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary — Tel : 037-2228019, Fax : 037-2223777, e-mail : chiefsecretary@nw.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය / பிரதான செயலாளர் அலுவலகம் / Chief Secretary's Office — Tel : 037-2231769-72, Fax : 037-2222234, e-mai : csnwp@sltnet.lk, Web site : www.cs.nw.gov.lk

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය කළමනාකරණ) / பிரதி பிரதான செயலாளர் (நிதி முகாமைத்துவம்) / Deputy Chief Secretary (Financial Managment) — Tel : 037-2228128, Fax : 037-2223731, e-mail : dcsfnnwpc@yahoo.co, dcsfinance@nw.gov.ll